**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදාවන් සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තූතිය පිරිනමමු.**



# තමිළිනීගේ කතාව 3

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

# 'ජය සිකුරු' මෙහෙයුමට මුහුණදීමට Do or Die

1997 වසර පුරාම කිලිනොච්චි ප්‍රදේශයේ සත්ජය හමුදා මෙහෙයුම ක්‍රියාත්මක විය. දේශපාලන අංශයේ කාන්තා අංශයට අයත් සටන්කාමීන්ද ප්‍රහාර සඳහා සූදානම් කෙරිණි. අපගේ අධ්‍යාපන කණ්ඩායමද ප්‍රහාරක බල ඇණියට එක් කළ අතර සටන්කාමීන් තිස් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක නායකත්වය මා වෙත පැවරිණි. උරුත්තිරපුරම් හින්දු විදුහල ආසන්නයේදී අපේ කණ්ඩායම් සඳහා ප්‍රහාරක පුහුණුවීම් සිදු විය. එම පාසලේ පරිසරය අපගේ පාසල් වියේ බොහෝ අතීත මතකයන් යළිත් අවදිකරවීමට සමත්විය. මම බොහෝ තරගවලට සහභාගීවීම සඳහා අපේ පාසලේ සිට උත්තිරපුරම් හින්දු  විදුහලට ගොස් ඇත්තෙමි. එම විදුහල් ක්‍රීඩා පිටියෙහි පැවැත්වූ දැල් පන්දු තරගවලට සහභාගී වී ඇත්තෙමි. විශාල ශාලාවකින් යුතු එම විදුහලේ වේදිකාවේ විවාද තරගවලටද සජීක තරගවලටද සහභාගි වී තෑගි ලබා ඇත්තෙමි.

1990 වසරෙහි හෝ 1991 වසරෙහිදී හෝ උසස් පෙළ පන්තියේ සිසුවෙක් එම පාසලෙහි පිටුපස වූ ක්‍රීඩා පිටියට එල්ල වූ ගුවන් ප්‍රහාරයකට අසුවූයේය. එයින් ඔහුගේ ජීවිතය අහිමි විය. සත්‍යශීලන් නම් වූ ඔහු මා සමඟ එකම පෞද්ගලික පන්තියෙහි අධ්‍යාපනය ලැබුවෙකි. ඔහුගේ මරණය පාසල් සිසුන් වූ අප තුළ එවක මහත් හැඟුම්බර තත්ත්වයක් ඇති කිරීමට සමත් විය.

1997 වන විට මගේ උපන් ගම වූ පරන්තන් බියකරු යුද්ධ බිමක් බවට පත්වී තිබුණි. අපේ පවුලේ අය සිටින්නේ කොහේද යන්න දැනගැනීමට පවා මට නොහැකි විය. ස්කන්ධපුරයට එසේත් නැත්නම් ධර්මපුරයට යන්නට ඇතැයි මම සිතා උන්නෙමි. මහ පොළොව විශ්වාස කරගෙන ගොවිතැනින් ජීවිකාව පවත්වාගෙන ගිය අපේ පවුලේ අය අවතැන්වී ගොස් කෑමක් බීමක් පවා නොමැතිව මහත් වූ දුක් අනුභව කරනු ඇත යන්න සිතීම මට මහත් වේදනාවක් විය. සිසුන් නොමැති පාසල්ද, මිනිසුන්ගේ යෑම් ඊම් නොමැති වීදි ද, වල් වැදුණු වෙල් යායවල්ද මා තුළ ඇති කළේ අසහනකාරී මානසික තත්ත්වයකි. ජනතාව නැවතත් මෙම ස්ථානවලට පැමිණ සැනසිල්ලේ ජීවත්වීමට නම් අපි අරගලය කළ යුතුමය යන දැඩි විශ්වාසය මා තුළ විය. අරගල කර මා උපන් බිමේම මිය යෑමේ අවස්ථාව මට ලැබෙන්නේ නම්



එය මහත් සේ භාග්‍යයක් යැයි මම සිතුවෙමි. පරන්තන්-මුලතිව් මාර්ගයෙහි දෙවන සැතපුම් කණුව නම් ස්ථානයෙහි අපගේ කණ්ඩායම සඳහා වන ස්ථානය සකස් කර තිබුණි. එය මුවාවීමට කිසිම ආවරණයක් නොමැති තැනි බිමක් වූ හෙයින් අපගේ කුඩා චලනයක් පවා හමුදාවට නිරීක්ෂණය කළ හැකි විය. නිතර නිතර එල්ලවන කෙටිදුර මෝටාර් ප්‍රහාර හේතුවෙන් දිනපතා සටන්කාමීහු බොහෝ දෙනෙක් තුවාලවලට ලක්වීමත්, මිය යාමත් සිදුවිය. එහෙයින් දිග කාණු කපන ලෙසට අපට අණ කර තිබුණි. රාත්‍රී කාලයෙහිදී ආරක්ෂක කටයුතුවලද, දහවල් කාලයෙහි යුද්ධ පුහුණු කටයුතු සහ කුඹුරුවල ආරක්ෂිත ඇලවල් කැපීම් කටයුතුවලද වශයෙන් දුෂ්කර කාර්යයන්හි නිරත වූයෙමු. හමුදාවේ යුද්ධ ටැංකි මහත් හඬ දෙමින් සෑම විටෙකම අප බිය ගන්වමින් තිබුණි.
වෙල් යායවල් සහ තාර නොදැමූ පාරවල් පසුකරමින් යුද්ධ ටැංකි ඉදිරියෙන් පැමිණෙද්දී ඒවාට පසුපසින් හමුදාව ඉදිරියට පැමිණ ප්‍රහාර දියත් කරන සටන් උපක්‍රමය හමුදාව 'සත්ජය' හමුදා මෙහෙයුමේදී භාවිත කළේය. හමුදාවේද ටැංකිවලට පහර දී ඒවායේ ගමන නතර කිරීම සඳහා ආර්.පී.ජී. බර අවි කණ්ඩායම සටන්කාමී සහෝදරියන්වද අපගේ ප්‍රදේශයෙහි ස්ථානගත කර තිබිණි.

රාත්‍රියේ අපගේ ඉදිරි ආරක්ෂක මුර කපොලු ද පසුකරමින් කුඩා කණ්ඩායමක් ලෙස ඉදිරියට ගොස් හමුදා මුරපොළවලට ආසන්නයෙහි ස්ථානගතවී හමුදාවේ රාත්‍රී කාලයේ ගමන් බිමන් නිරීක්ෂණය කළ යුතුය. අපේ ඉදිරි ආරක්ෂක මුර කපොලු ඉදිරියට ගැනීමට සූදානම්වී හමුදාව විසින් කරනු ලබන ප්‍රහාර ව්‍යර්ථ කිරීමේ ප්‍රහාර එල්ල කරන අතරතුර එම කුඩා කණ්ඩායම වේගයෙන් දුවගෙන විත් අප සමඟ එක්විය යුතුය. මෙහිදී යම් කිසි ප්‍රමාදයක් සිදුවුවහොත් දෙපාර්ශ්වයේම ප්‍රහාර සීමාව තුළ සිරවී ජීවිත අහිමි කරගැනීමට සිදුවෙයි.

මෙම නිරීක්ෂණ කාර්යයන් සඳහා අපේ කණ්ඩායමද නිතර යැවිණි. දිනක් මැදියම් රැයෙහි මුරසුමෝට්ටෙට වීදියෙහි පිහිටා තිබූ වයි.එම්.සී.ඒ. ගොඩනැඟිල්ල ආසන්නයේ වූ කුඩා පටුමගෙහි වැටට මුවාවී අපේ කුඩා කණ්ඩායම් රැඳී උන්නේය. හමුදාවේ පැරා ලයිට්වල ආලෝකය දහවල මෙන් විය. හිස එසවීමට නොහැකිව අපි පොළොවෙහි වැතිර උන්නෙමු. අප අවට වූ පඳුරු, ගස්වැල් ආදිය අව්වෙන් වියැළී ගොස් තිබුණි. එක්වරම එල්ල වූ හමුදාවේ කාලතුවක්කු ප්‍රහාරයකින් එම පඳුරු ශබ්ද නඟමින් දැවෙන්නට විය. කළ යුත්තේ කුමක්දැයි නොදැන සිටි අපි ගංසූරිය ගසක අතු කඩාගෙන මඳක් අඩුවෙන් ගිනිගෙන දැවෙමින් තිබුණු පැත්තෙන් ගොස් එම ගිනි ජාලාවලට මැදි නොවී බේරී දුවන්නට පටන් ගත්තෙමු. අමුතු ශබ්ද හමුදාවට ඇසුණා විය හැකිය. ස්වල්ප වේලාවකින් බර අවිවල දැඩි ප්‍රහාර එල්ල විය. මෝටාර් ප්‍රහාර දෙක තුනක්ද එල්ල කිරීමෙන් පසුව නිහඬ විය. මා සමඟ පැමිණි එක් සාමාජිකාවකගේ පමණක් තුවාල අතක් විය. අපේ මුරපොළේ සිටි සටන්කාමියෝ මහත් ඉහළට නැඟුණු ගිනිදැල් දුටුවිට තමන්ට තවදුරටත් පණ බේරාගෙන ඒමට හැකි වෙතැයි නොසිතුණු බව කීහ.



තවත් එක් දිනයක හොඳටම අඳුර වැටුණු පසු අපගේ කණ්ඩායම් මඳක් ඉදිරියට ගෙන ස්ථානගත කළ යුතුය යනුවෙන් හදිසි දැනුම්දීමක් ලදිමි. පසුදින අළුයම හමුදාව ඉදිරියට පැමිණීම සිදුවිය හැකි බැවින් බලාපොරොත්තු සහගතව සූදානම්ව සිටිය යුතුය යනුවෙන් දැනුම් දුන්හ. අපේ කණ්ඩායම් සහ හමුදාව අතරේ පැවතියේ ඉතාමත් සුළු දුරකි. කණාමැදිරි එළියක් දුටුවත් වහාම එම ස්ථානයට වෙඩි ප්‍රහාර එල්ල වන තත්ත්වයක් තුළ එම ගන අඳුරේ එකෙක් අනෙකාව අල්ලා ගෙන ගමන් කර සඳහන් කළ සලකුණ හඳුනාගෙන අපේ කණ්ඩායම් ස්ථානගත කළෙමු. මගේ ස්ථානය වූයේ ඇලක් අසලයි. මුරකාවල් ස්ථාන සංවිධානය කර ගෝණි උරයක් එළා මඳ වේලාවක් නිදා ගැනීමට උත්සාහ කළෙමි. හාන්සි වූ වහාම පිටපැත්තේ කුමක්දෝ දඟලන, දිගහැරෙන බවක් දැනෙන්නට විය. සද්ද බද්ද ඇති නොවන ලෙසින් මම මා ළඟ නිදාගෙන උන් ආරච්චෙල්වි නම් සටන්කාමී සහෝදරියව හෙමිහිට ඇමතුවෙමි. ''මම හෙමින් සැරේ නැගිටින්නං. උඹ පුළුවන් තරම් නැමිලා ටෝච් එළිය මුවාකරගෙන මගේ පිට යට තියෙන්නේ මොකක්ද කියලා බලපන්'' යැයි කියා හිමිහිට නැඟිට්ටෙමි. සුදට සුදේ දිලිසෙමින් ගුළිවී සිටි සර්පයෙක් දඟලන්නට විය. ''සර්පයෙක් දැක්කම බල සේනාවක් වුණත් වෙවුලනවා.'' යැයි කියති. ඉතින් මා ගැන කිව යුතුද? මගේ දෙපා පණ නැතිව ගොස් හිස කැරකෙන්නා සේ විය. එහෙත් වහාම මම හිත දිරිගෙන කළ යුත්තේ කුමක්දැයි සිතන්නට වීමි. මේ මොහොතේ මෙම සර්පයාට පහරදී මරා දැමිය නොහැකිය. එහි වූ බංකරයක් තුළට උෟව තල්ලු කර දමා එළියට ඒමට නොහැකි අයුරින් ආරක්ෂිත ලෙස වසා උදෑසන උෟව නිදහස් කළෙමි. ඉදිරි සටන් බිමෙහි ක්‍රියාකාරකම්වල මහත් උනන්දුවෙන් යෙදී සිටියෙමි. පසු පසට පැමිණ සිටින ලෙසත්, සංවිධානය විසින් දැනුම්දෙනු ලබන ඕනෑම මොහොතක ඕනෑම කාර්යක් ඉටු කිරීමට සූදානම්ව සිටින ලෙසත් අපේ ප්‍රහාර කටයුතු බාරව සිටි ලුතිනන් කර්නල් තණිකෙච්චෙල්වි මා හට පවසා මාව පිටුපසට යැව්වාය. සංවිධානයේ අනාගත අවශ්‍යතා සැළකිල්ලට ගෙන දේශපාලන අංශයට සටන්කාමී සහෝදරියන්වත් එකතු කරගත යුතුව පවතින බවත්, එම වගකීම බාරගෙන කටයුතු කරන ලෙසත් දේශපාලන අංශයෙහි බාරකරු තමිල් චෙල්වන් මට පැවසීය. ඒ අනුව මූලික ඉංග්‍රීසි දැනුමක් සහිත ගැහැනු ළමුන්ව තෝරාගෙන ඔවුන්ට අමතර ඉංග්‍රීසි පන්ති, දේශපාලන පන්ති සහ පරිගණක පන්ති සංවිධානය කළෙමි. අධ්‍යාපන කණ්ඩායමේ කටයුතු සමඟ ඔවුන්ගේ පාලනය පිළිබඳ වගකීම ද මා වෙත පැවරුණි.

1997-98 කාලයේ දී සෑම ප්‍රදේශයකම කටයුතු කළ දේශපාලන අංශ භාරකරුවෝ ජනතාව අතරෙහි

38 වන පිටට